''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
**Online ISSN: 2394-6792**
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
**වෙළුම: 2; I කලාපය; 2023 මාර්තු; පිටු: 19-24**

# නාරි සූත්‍රය කාව්‍යාලේඛය පිළිබඳ ස්ත්‍රීවාදී කියැවීමක්

**භාග්‍යා දිල්හානි මාබුලගේ**
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
bhagyadilhani@sjp.ac.lk

**සංක්ෂේපය**

මෑත කාලීන ව බිහි වූ බොහෝ කිවිඳියන් අතර අනුරාධා නිල්මිණී, බහුල වශයෙන් ස්ත්‍රීත්වය හා ස්ත්‍රීවාදය පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ නියැළෙන තැනැත්තියක ලෙස හඳුන්වා දිය හැකි ය. යුග'ස්ත්‍රී, වත් සියපත්, මඳහසක මැදියම, රිදුම් පිරි පිරිමැදුම් වැනි කාව්‍ය කෘති ඔස්සේ සහෘද ජනයා අතරට පැමිණි ඇයගේ නවත ම නිර්මාණය වන නාරි සූත්‍රය නම් කාව්‍ය නිර්මාණ සංග්‍රහය, තේමාත්මක නව්‍යත්වය, නව කාව්‍ය ආකෘති භාවිතය, භාෂා ශෛලිය යනාදී ලක්ෂණ අනුව විශේෂාවධානයට පාත්‍ර වන බව සැලකුව මනා ය. කාන්තාව කෙරෙහි කාන්තා ඇසකින් බලන කල්හි ඇයගේ දෘෂ්ටියට හසු වන දෑ ප්‍රතිනිර්මාණය වන ආකාරය ද ඇයට ම අනන්‍ය වේ. ඒ අනුව අනුරාධා නිල්මිණීගේ නාරි සූත්‍රය නම් කාව්‍යාලේඛය, ස්ත්‍රීවාදී සමාජ න්‍යාය ඔස්සේ කියැවීම මෙම අධ්‍යයනය මගින් සිදු වේ. අධ්‍යයනයේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අනුරාධා නිල්මිණී විසින් රචිත නාරි සූත්‍රය කාව්‍යාලේඛය ද, ද්විතීයික මූලාශ්‍රය ලෙස ස්ත්‍රීවාදය පිළිබඳ ලියැවී ඇති ශාස්ත්‍රීය කෘති ද භාවිත කෙරිණි. කිවිඳියගේ නාරි සූත්‍රය නම් නිර්මාණ සංග්‍රහය, දැනට ජීවමාන මෙන්ම ජීවමාන නොවන, ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ චරිත හා සම්බන්ධ වීමෙන් ජාතික හෝ ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ, එසේත් නැතිනම් කුමන හෝ සුවිශේෂ සිදුවීමක් හේතු කොට ගනිමින් සමාජයේ කතිකාවට ලක් වූ සැබෑ ස්ත්‍රී චරිත දහසයක් පාදක කොට ගනිමින් රචනා වූවකි. එහිලා සඳහන් වන කාන්තා චරිත, දැරියක, පෙම්වතියක, බිරිඳක, මවක ලෙස නැතිනම් කුමන හෝ සන්දර්භයක් තුළ දී ඊට මැදිහත් වී කටයුතු කරන ස්ත්‍රියක වශයෙන් සහෘදයා වෙත පැමිණේ. කිවිඳියගේ විශේෂාවධානය හිමි කර ගත් විවිධ කාන්තා චරිත ඔස්සේ 'ස්ත්‍රිය' නමැති සමාජ සත්ත්වයා, අනේකවිධ සමාජ බලවේග හමුවේ හැසිරුණු ආකාරය පිළිබඳ සහෘදයාගේ චිත්ත සන්තානයෙහි විචක්ෂණශීලී වූත්, හෘදය සංවේදී වූත් සිතුවමක් ගොඩනැගීමේ අපේක්ෂා සහිත ව 'නාරි සූත්‍රය' නම් නිර්මාණ සංග්‍රහය 'කාව්‍යාලේඛය' යන ඡායානුගත නාමයෙන් හඳුන්වන්නට ඇතැයි සිතේ.

**මුඛ්‍ය පද:** නාරිසූත්‍රය කාව්‍යාලේඛය, ස්ත්‍රිය, ස්ත්‍රීවාදය

## හැඳින්වීම

ස්ත්‍රීවාදය (Feminism) යන පදය සමාජ න්‍යායයක්, විචාරාත්මක මෙන්ම විවාදාපන්න මතවාදයක් වශයෙන් සමාජ කතිකාවට ලක් වන්නේ 19 වැනි සියවසේ සිට ය. කෙසේ නමුත් පුරුෂාධිපත්‍යය හමුවේ පීඩාවට පත් වූ ස්ත්‍රීන් පිළිබඳ විවිධ අදහස් හා මතවාද ඊට පූර්ව අවධියේ දී ද නොයෙක් විට ප්‍රකාශ වුව ද, න්‍යායයික පසුබිමක් මතින් මෙම සංකල්පය ගොඩනැගී වඩාත් ප්‍රචලිත වූයේ 19 වැනි සියවසේ දී ය. මාරි වොලස්ටන්ක්‍රාෆ්ට් (Mary Wollestonecraft) විසින් වර්ෂ 1792 දී ලියන ලද *A Vindication of the Rigths of Women* නම් කෘතිය මගින් ප්‍රකාශයට පත් කළ අදහස් මේ අයුරින් කාලයක් පුරා වර්ධනය වෙමින් මතවාදයක් බවට පරිවර්තනය වී ඇත. මෙම සංකල්පය ඔස්සේ ප්‍රධාන වශයෙන් පුරුෂයාට සාපේක්ෂ ව සමාජ, ආර්ථික හා දේශපාලන පසුබිම්වල දී ස්ත්‍රියට හිමි වන සමතුලිත නොවූ තත්ත්වය හා පුරුෂ මූලික සමාජයේ පවුල, සමාජය, ලෝකය තුළ ඇයට හිමි වන ද්විතීයික ස්ථානය පිළිබඳ අවධාරණය කරමින් එම තත්ත්වය නැති කර දැමීම සඳහා අවැසි ක්‍රියා මාර්ග යෝජනා කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම හා විමර්ශනය කිරීම සිදු කරනු ලැබේ.

මේ අනුව ස්ත්‍රීවාදය යනු සමාජයේ සෑම ක්ෂේත්‍රයක දී ම ස්ත්‍රිය වෙත හිමි කොට ඇති අප්‍රධාන බව, සාපෙක්ෂ අසමානත්වය හෙවත් වෙනස් කොට සැලකීම හා ඇයව පීඩනයට හා සූරාකෑමට ලක් කිරීම පිළිබඳ ව සංවේදීතාවක්, සවිඥානිකත්වයක් සහිත වූත්, එකී අසමානතා, අප්‍රධාන බව, පීඩනය හා සූරාකෑම දුරුකොට, සමාජයේ සෑම අංශයකදී ම පුරුෂයන්ට හා සමාන සම සාධාරණත්වයක්

නිර්මාණය කිරීමේ මූලික අරමුණ සහිත වූත්, එම අරමුණු, අදහස් දරන්නන් ඒකරාශී කර ගනිමින්, ස්ත්‍රීන්ගේ නිදහස හා විමුක්තිය සඳහා ප්‍රතිපත්ති හා පොදු ක්‍රියාකාරිත්වයන් සැලසුම් කරන්නා වූත්, එම සැලසුම් හා ක්‍රියාකාරකම් මෙහෙයවන සමාජ හා දේශපාලන ව්‍යාපාරයක් සහිත වූත් දෘෂ්ටිවාදයක් ලෙස හැඳින්විය හැකි ය (ලියනගේ, වලාකුළුගේ, 2006: 39 පිටුව).

නූතන ස්ත්‍රීවාදයේ වර්ධනය උදෙසා මාග්‍රට් මීඩ්ගේ (Margaret Mead), *Sex and Temperament in Three Primitive Societies* නම් කෘතිය බෙහෙවින් ඉවහල් වන්නට ඇතැයි පැවසේ. විවිධ සංවර්ධන අවස්ථා මගින් ක්‍රියාත්මක ව සංවර්ධනය වූ ස්ත්‍රීවාදය හා ස්ත්‍රීවාදී ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය, රැලි ත්‍රිත්වයක් ඔස්සේ සමාජ වර්ධනයට ලක් වූ බව කියැවෙන අතර නූතන ස්ත්‍රීවාදය මෙහි තෙවැනි රැල්ල ලෙස සලකනු ලැබෙයි. එහිදී ස්ත්‍රීවාදයට පක්ෂපාතී ව අදහස් දක්වන පුද්ගලයන්ගේ විෂයය ධාරා ඔස්සේ මේ පිළිබඳ වන ඔවුන්ගේ දෘෂ්ටිය, යම් යම් සුවිශේෂතා පෙන්නුම් කරයි.

මේ ආදි වශයෙන් වූ ස්ත්‍රීවාදය විවිධ ප්‍රවේශ ඔස්සේ ක්‍රියාකාරී ව පවතින බව ගම්‍යමාන වන කරුණකි. ඒ අතර ලිබරල් ස්ත්‍රීවාදය, මාක්ස්වාදී ස්ත්‍රීවාදය, සමාජවාද ස්ත්‍රීවාදය, රැඩිකල් (ආන්තිකවාදී) ස්ත්‍රීවාදය, පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදය ප්‍රධාන ප්‍රවේශ ලෙස දැක්විය හැකි ය. මේ හැරුණු කොට අනධිකාරීවාදී ස්ත්‍රීවාදය, මනෝවිශ්ලේෂණීය ස්ත්‍රීවාදය, පරිසරවාදී ස්ත්‍රීවාදය, සංස්කෘතික ස්ත්‍රීවාදය, තෙවන ලෝකයේ ස්ත්‍රීවාදය යනාදිය ස්ත්‍රීවාදය සඳහා වන උප ප්‍රවේශ යනුවෙන් හඳුන්වනු ලැබේ. ඒ අනුව මෙහිදී මෙම ස්ත්‍රීවාදී ප්‍රවේශ ඔස්සේ ද, 'නාරි සූත්‍රය' කාව්‍යාලේඛය විමසුමට ලක් කිරීමට අපේක්ෂා කෙරේ.

**සාකච්ඡාව සහ සොයාගැනීම්**

නාරිසූත්‍රය කාව්‍යාලේඛය පිළිබඳ විමසීමට පූර්වයෙන් කාව්‍ය කෘතියෙහි ආරම්භයේ දී මෙන්ම පසුපිටෙහි දක්නට ලැබෙන මෙහි සඳහන් පද්‍යය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් යැයි හැඟේ.

''ධනවාද
සමාජවාද
කුලවාද
පන්තිවාද
ගෝත්‍රවාද
ස්ත්‍රීවාද
පුරුෂවාද
කුරානවාද
කොන්තවාද
ථේරවාද
අන්තවාද (නිල්මිණි, 2021: 13 පිටුව).

මෙහිදි කිවිඳිය සහෘදයා වෙත යෝජනා කරනුයේ ලොව විවිධ සන්දර්භවල දී ගොඩනැගී, කතිකාවට ලක් වූ නොයෙකුත් මතවාදවලින් තොර ව මනසින් නිරුවත් ව නිර්මාණ සංග්‍රහය භුක්ති විඳින ලෙස යි. එක පෙළට නම් කර දක්වා ඇති මතවාද ලැයිස්තුව අතර ස්ත්‍රීවාදය හා පුරුෂවාදය වෙන් ව විශේෂයෙන් දක්වාලීම මෙහිලා සුවිශේෂ කොට සැලකිය හැකි යැයි හැඟේ. සියලු මතවාදවලින් තොර ව නිරුවත් මනසින් කාව්‍යාවලිය රසවිඳින සහෘදයා ඉදිරියේ කිවිඳිය තෝරා ගත් තේමාවන්ට අනුකූල ව පුරුෂෝත්තමවාදි නිරුවත හෙළි වීම වැළැක්විය නොහැකි ය. එසේ බලන කල්හි සහෘදයා නිරුත්සාහක ව මෙම කාව්‍යාලේඛය රස විඳින්නේ සැබවින් ම ස්ත්‍රී-පුරුෂවාද මත පදනම්ව ය. එනිසා ම මෙම අධ්‍යයනය ද ස්ත්‍රීවාදය මත පදනම් ව ගොඩනගන ලද බව සැලකුව මනා ය.

කිවිඳිය කාව්‍යාවලිය පෙළ ගැස්වා ඇත්තේ නව ආකෘතිකමය සැලසුමකට අනුව ය. නොයෙක් ආකාරයේ සමාජ අසාධාරණකම්වලට ලක් ව අසරණ වූ කාන්තාවෝ දහසය දෙනෙක් තමන්හට සිදු ව ඇති අයුක්තිය පිළිබඳ පැමිණිල්ල, සිය දුක් ගැනවිල්ල කාලයේ විනිසුරු ඉදිරියේ දිග හරින්නෝ ය.

අහෝ, කිසිවෙකු ඇස නොගැටී
සියවස් කලක් දුක දැරූ අකුරු
බොහෝ ලිපිවල ලියා තිබුණේ
නිහඬ කඳුළක, කතා පොකුරු
මහෝසය අතකින් වසා, ඒ
මතින් සතුටේ පැහැය තැවරූ
සහෝදරියන්, නමිනි අද, විනිසුරු
විමානේ ලකුණු පුවරූ (නිල්මිණි, 2021: 18 පිටුව).

නීතියේ ආධිපත්‍යය යටතේ ද අසාධාරණයට ලක් වූ කාන්තාවට කුමන හෝ විසඳුමක් ලබා දෙනු පිණිස කාලයේ විනිසුරු ඔවුන්ට සවන් දීමට ඉදිරිපත් වෙයි. දේශපාලනික හෝ වෙනත් හේතු කාරණා නිසා නීතිය හමුවේ යුක්තියක් ඉටු නොවන කල්හි අසාධාරණයට ලක් වූ තැනැත්තා විඳින කායික හා මානසික පීඩාව අතිශය ප්‍රබල ය. ඒ අතුරිනුත් කාන්තාව විශේෂ කොට දැක්විය යුතු වන්නේ නීතිමය කාරණාවල දී බොහෝ අවස්ථාවල පුරුෂයාට සාපේක්ෂ ව ඇය අනාරක්ෂිත පරිසරයක්

වෙත නිරාවරණ වන බැවින් ය. ලිබරල්වාදී ස්ත්‍රීවාදයට අනුව සමාජ, දේශපාලන, ආර්ථික හා නීතිමය ක්ෂේත්‍රවල දී පුරුෂයාට සාපේක්ෂ ව ස්ත්‍රියට ද සම අවස්ථා හිමි විය යුතු වුවද, එසේ සිදු වන අවස්ථා බෙහෙවින් සීමිත ය. මෙම විනිසුරුවරයා 'කාලයේ' විනිසුරු වූයේ ද කාලීන වශයෙන් ගත් කල්හි දීර්ඝ ඉතිහාසයක් සහිත ඇතැම් සිදුවීම් වසර ගණනාවක් මුළුල්ලේ යුක්තිය බලාපොරොත්තුවෙන් නීතිය හමුවේ කල් මරන බැවිනි.

මෙහි සඳහන් කාන්තාවන් දහසයදෙනා විසින් විනිසුරු ඉදිරියේ ඉදිරිපත් කරනු ලබන අවනඩු, කිවිඳිය නම් කර ඇත්තේ 'හර්ද වාචික' යන නාමයෙනි. කිසියම් පුද්ගලයකුගේ හදවත පෙළන කිසියම් සංවේදනයක් සාර්ථක අයුරින් ප්‍රතිනිර්මාණය කරන්නට නිර්මාණකරුවකුට හැකි වේ නම් එය ඔහු හෝ ඇය විසින් ලබන ලද අතිශය දුර්ලභ හැකියාවක් ලෙස දැක්විය හැකි ය. නිර්මාණය රස විඳින පුද්ගලයා කෙරෙහි ද, තමන් විසින් විඳිනු ලැබුවා වූ සංවේදනා, ඒ ආකාරයෙන් ම හෝ ඇතැම් විටෙක එය අභිභවා යන ආකාරයෙන් හෝ ඊට සමාන වන පරිදි දැන වීමට උත්සහ කරන නිර්මාණකරුවා ඊට නොයෙක් උපක්‍රම භාවිත කරයි. උපයුක්ත භාෂාව එහිලා ප්‍රමුඛ කාර්යයක් ඉටු කරනු ලැබේ. සිය නිර්මාණ කෘතිය උදෙසා වස්තු විෂයය වන කාන්තා චරිත උපක්‍රමශීලී ව උසුරුවීමට යත්න දරන නාරි සූත්‍රයේ කිවිඳිය, සහෘදයාගේ හෘදයට ආමන්ත්‍රණ කිරීමේ අභිලාෂයෙන් යුතු ව සිය නිර්මාණ 'හර්ද වාචික' යන නාමයෙන් හඳුන්වා ඇත. එකී ප්‍රයත්නය ඇතැම් නිර්මාණ ඔස්සේ සාක්ෂාත් කර ගැනීමට ඇය සාර්ථක අයුරින් සමත් වී ඇති බව පැවසිය යුතු වේ.

කිවිඳියගේ හෘද වාචික අතර පළමු හෘද සාක්ෂිය ඉෂාලිනී ජූඩ් දැරියගේ ය. පසුගිය කලෙක සමාජයේ ආන්දෝලනයක් ඇති කිරීමට හේතු පාදක වුණු මෙම දැරිය, වතුකරයේ සිට මෙහෙකාර සේවය සඳහා කොළඹට පැමිණ සිටින අතරතුර සිරුරට ගිනි ඇවිලීමෙන් දහසය හැවිරිදි වියේ දී මිය ගියා ය. පූර්වයේ දී ඇයගේ මරණය සිය දිවි නසා ගැනීමක් යැයි පැවසුව ද, පසුව එය ඝාතනයක් ලෙස ද අර්ථකථන ඉදිරිපත් ව තිබුණි.

ඉසාලිනී වෙමි, ඉස ගිනිගෙන දැවුණු
වසා තිර දොරටු රතු ගිනිදැල් මැවුණු
කසායක් තමයි, එක හැළියක පැහුණු
අසා පන් ඒ'දුක තෙත දර මිටි බැඳුණු
(නිල්මිණි, 2021: 21 පිටුව).

වතුකරයේ ජීවත් වෙමින්, නා කපන වැසි, නායයාම්, හුළං කෝඩ මැද ඉතා දුෂ්කර දිවි පෙවෙතකට උරුමකම් කියන මෙරට වතුකර ජනතාව විසින් මුහුණ පානු ලබන සුලබ ඛේදවාචකයක තත්ත්වය මෙම දැරියගේ සිදුවීම ඔස්සේ ප්‍රකාශ වේ. රටෙහි පවතින අසමතුලිත ආර්ථික ක්‍රමය හමු වේ දරුවන් කිහිප දෙනෙකුගෙන් යුත් පවුලක සාමාජිකයන්හට ආහාර සඳහා එක් වේලක් හෝ උපයා ගැනීම මහත් අභියෝගයකි. එසේ වන කල දරුවන්හට අධ්‍යාපන පහසුකම් සලසා දීම මෙවැනි දෙමවුපියන්ට නම් සිහිනයකි. මෙනිසා මවුපියන් හා එක් ව ජීවන අරගලයට උර දෙනු වස් මෙහෙකාර සේවයට පැමිණෙන ඉෂාලිනීලා වර්තමානයේ පමණක් නොව අනාගතයේත් බිහිවීම වැළැක්විය හැකි කරුණක් නොවන්නේ ය. ස්ත්‍රීවාදී චින්තකයන් පවසන ආකාරයෙන් අධ්‍යාපන ලැබීමට කාන්තාවට පවතින සම අයිතිය, නිදහසේ ජීවත් වීමට පවතින අයිතිය ධනපති පාන්තිකයන් හමුවේ අඩපණ වන බව ප්‍රත්‍යක්ෂ වන කරුණකි. මාක්ස්වාදී ස්ත්‍රීවාදයේ ප්‍රධාන තර්කය නම් ස්ත්‍රිය උදෙසා සම අයිතීන් හිමි කර ගැනීමට නම් පංක්ති අරගලය හා විප්ලවය මතින් පවතින ධනවාදී ක්‍රමය වෙනස් කර, පංක්ති රහිත කොමියුනිට්ස් සමාජයක් බිහි කළ යුතු යන්න යි. පෞද්ගලික දේපළ හිමි සමාජයෙන් වියුක්ත ව සාමූහික දේපළ හිමි සමාජ ක්‍රමයක් ඇති කිරීම, මෙම චින්තනය අනුව මීට විසඳුම වුවත් ශ්‍රී ලංකාව වැනි දේශපාලනික සාධක හමුවේ ද ධනපති ප්‍රජාව බිහි කරන රටක එය ක්‍රියාත්මක කළ හැකි වේද යන්න පවතින ගැටලුවකි. එබඳු විසඳුමක් පේන මානයකවත් නොමැති සමාජ ක්‍රමයක් තුළ ඉෂාලිනී දැරිය, වඩා මෑත අතීතයේ සමාජයට නිරාවණය වූ එක් සිදුවීමක් බවත්, එසේ අනාවරණ නොවී යටපත් වී යන සිදුවීම් ප්‍රමාණාත්මක ව අධික බවත් සිහි තබා ගත යුතු ය.

හොයන්නට එපා, ගිනි ඇවිලුණු විදිය
අහන්නට එපා, තව තව කළ හිදිය
වහන්නට කලින් තේ දලු දුක් පොදිය
මහන්නට ඉරුණු, ඉරණම කල් මදිය
(නිල්මිණි, 2021: 22 පිටුව).

කාලයේ විනිසුරු හමුවට මෙම අවනඩුව ඉදිරිපත් වුව ද, දැන් ඊට සාධාරණයක් සෙවීම අපහසු ය. ඇය ජීවත් ව සිටිය දී මෙම අසාධාරණ සමාජ ක්‍රමය වෙනස් කිරීමට උත්සහ නොකළවුන්, ගිනි ගෙන දැවී ගිය ඉෂාලිනීගේ ඉරණම වෙනස් කිරීමට අදටත් සිදු කරන දෙයක් නොමැත.

මීළඟ හෘද සාක්ෂිය 'අවිහිංසාවාදයේ පියා' යන විරුද නාමයෙන් හඳුන්වන මහත්මා ගාන්ධිගේ (මොහන්දාස් කරම්චාන්ද් ගාන්ධි) බිරිඳ වන 'කස්තුර් බා'ගේ ය. ඉන්දියානු සාම්ප්‍රදායික විවාහ ක්‍රමය අනුව කුඩා අවදියේ දී ම විවාහ දිවියට ඇතුළත් වන කස්තුර් බා අකුරු කියවීමට, ලිවීමට නොදන්නා දැරියකි.

'බා' ය ගුජරාටයේ මකාර්ජි පෙළපතේ
'මා' ය අම්මා එකම ලෝකයේ භාරතේ
රෑ, දවල් මිස, අකුරු නොදනිමිය මළපොතේ
'මහත්මා' නමින් ගෙල සිරකෙරූ හදවතේ
(නිල්මිණි, 2021: 23 පිටුව).

ඉන්දියානු සංස්කෘතිය අනුව ළමා වියේදීම දැරියන් විවාහ වීම සුලබ සිදුවීමකි. ඇතැම් විටෙක ඉතා ළාබාල වියේ දැරියන් වයසින් වැඩිමහලු පුරුෂයන් සමග විවාහ වන අවස්ථා ද කොතෙකුත් දකින්නට අසන්නට ලැබේ. කුල ක්‍රමයේ පවතින සාම්ප්‍රදායික නීති සමුදාය හමුවේ විවාපත් වන ස්ත්‍රියගේ සිතුම් පැතුම්, හැසිරීම් රටා, ඇඳුම් පැළඳුම් යනාදි සාධක සියල්ලට ම පාහේ පැනවෙන වාරණය 'මහත්මා නමින් ගෙල සිරකෙරූ හදවතේ' යන පදයෙන් පැහැදිලි ය. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව ස්ත්‍රිය කුඩා කල පියා යටතේ ද, විවාපත් වූ පසු ස්වාමියා යටතේ ද, ස්වාමියා මිය ගිය පසු පුත්‍රයා යටතේ ද ජීවත් විය යුතු අයෙකි. එකී සම්ප්‍රදායයෙහි ස්ත්‍රිය නමැත්තිය අර්ථ ගන්වන්නේ කිසිදු කාර්යයක් තනි ව කළ නොහැකි, ලඳ බොළඳ, සියුමැලි, දුරදිග නොබලා කටයුතු කරන, උසස් ශාස්ත්‍ර ඉගෙනීමට සුදුසු නොවන ජීවියෙකු ලෙස ය. ඇයගේ දිවියේ ප්‍රමුඛ කාර්යය විය යුත්තේ යම්තම් වැඩිවියට පැමිණීමත් සමග විවාහ වී දරුවන් ඉපද වීමයි. එසේ උපදවන දරුවන් පුරුෂ ලිංගික නොවුණහොත් එය ද ඇය සමාජයේ පීඩාවට ලක් කිරීමට හේතුවකි. ඒ අතින් කස්තුරි බා නම් හරිලාල්, මනිලාල්, රාම්දාස්, දේව්දාස් නම් පුත්‍රයන් සිවු දෙනෙකු ලැබීමට වාසනාවන්ත වූවා ය. එනමුදු සිය විවාහයත් සමග මගහැරී ගිය ළමා කාලය හෝ විවාහයෙන් පසු ව ඇය අපේක්ෂා කළ ප්‍රේමය ඇයට හිමි වූයේ නම් නැත.

බ්‍රහ්ම දිවි පෙවතකිය, දැන් මගේ හීනේ
ඉතින් තව කුමට මා, සැතපෙම් ද යහනේ
පුරා තිස් අට වසක් තනි පතිනි දැහැනේ
මනුස්මෘතියේ ගැහැනු, බුදු වුණේ නැහැනේ
(නිල්මිණි, 2021: 24 පිටුව).

බ්‍රහ්මචාරීත්වය නිසා සිය ස්වාමියා නිදි යහන ප්‍රතික්ෂේප කරන කල්හි කස්තුරි බා වසර තිස් අටක් ඔහු වෙනුවෙන් පති දම් ආරක්ෂා කළා ය. ගාන්ධිතුමා ඉදිරියේ ලෝකයක් ගෞරව කරන කල්හි ඔහු හා සමග දිවි ගෙවූ බිරිඳ කළ කැපවීම කිසිදු අවස්ථාවක ලෝකයාට පෙනුණේ නැත. ඒ බැව් පද්‍ය පන්තියේ සඳහන් 'ලෝකයක් දන්න මහ බලවන්ත බලකණු, යට දිරාගිය ගැහැනු, ඇති තවත් විමසනු' යන පාඨයෙන් වඩා තහවුරු වේ. කෙසේ වෙතත් ස්ත්‍රීවාදී සංකල්ප ලොව ප්‍රචලිත වීමත් සමග ඉන්දියානු සමාජය ඇතුළු ව (විශේෂයෙන් ආසියානු කලාපය තුළ) ලෝකයේ කාන්තාව කෙරෙහි තිබූ ඇතැම් සීමා සහ වාරණ යම්තාක් දුරකට ලිහිල් වී ඇති බව මෙහිලා පැවසිය යුතු වේ.

කිවිඳිය තෝරා ගෙන ඇති ස්ත්‍රී චරිත අතුරින් සකියා සාකි නම් ඇෆ්ගන් මාධ්‍යවේදිනියගේ හෘද සාක්ෂිය ද සහෘදයා සංවේගයට පත් කරන නිර්මාණයකි. තලේබාන් සංවිධානය විසින් ඇෆ්ගනිස්ථාන කාන්තාවන් උදෙසා පණවනු ලබන දණ්ඩනවලට එරෙහි ව සිය කට හඬ මෙහෙය වූ තැනැත්තියක ලෙස සකියා ප්‍රසිද්ධත්වයට පත් ව සිටී.

දැනගෙන හිටියෙ මම
උණ්ඩ කියන්නෙ
මල්වෙඩි නොවන
විත්තිය
නමුත්,
කියන්නට කැමතියි
බැරි බව හිල් කරන්නට
පතොරමකින්
ඇෆ්ගන් ගෑනුන්ගෙ
හදවතේ යකඩ බිත්තිය..... (නිල්මිණි, 2021: 82 පිටුව).

සිය ජීවිතය කිනම් හෝ මොහොතක උණ්ඩයකට ගොදුරු වන බව දැන දැන සකියා නිර්භය ව 'සාම ගුවන් විදුලිය' නම් ගුවන් විදුලි නාලිකාවක් ආරම්භ කර, අන්තවාදී තලේබාන්වරුන්ට විරුද්ධ මත සමාජගත කිරීමට උත්සහ කළා ය. අවසානයේ පූර්වයේ දැන සිටි පරිද්දෙන් ම වෙඩි වරුසාවකට මැදි ව සිය දිවියට සමු දෙන්නට ඇයට සිදු විය. කාලයේ විනිසුරු හමුවට ඇයගේ දුක් ගැනවිල්ල ඉදිරිපත් කිරීමට හේතු වූ කාරණය පිළිබඳ මෙහිදි අවධානය යොමු කළ යුතු ව ඇත. සකියා ඝාතනය කරන ලද්දේ 2007 වසරේ දී ය. අවම වශයෙන් මේ වන විට ඇෆ්ගන් කාන්තාවන් ඇය පැතූ නිදහස ලබා තිබෙන්නේ ද යන ගැටලුව උදෙසා ලැබෙන පිළිතුර නම් නැත යන්න යි. ලෝකයක් හමුවේ ඇෆ්ගන් කාන්තාවන් විඳින පීඩාව පිළිබඳ වරින් වර මාධ්‍ය ඔස්සේ ප්‍රකාශ වුව ද ඊට පිළියම් සෙවීමට

ඉදිරිපත්වන්නන් නොමැත. එසේ බලන කල්හි කාන්තාවන් වෙනුවෙන් පෙනී සිට, සිය ජීවිතය පවා ඒ වෙනුවෙන් කැප කළ ඇයගේ මරණයට සිදු ව ඇති සාධාරණයක් නොමැත. ඒ අනුව ස්ත්‍රීවාදීන් විසින් පුන පුනා ප්‍රකාශ කරනු ලබන ලිබරල්බාදි ස්ත්‍රීවාදය තබා, තමන් වෙනුවෙන් කතා කිරීමේ අයිතිය පවා අහිමි වූ කාන්තාවන් අදටත් මෙලොව වෙසෙන බව ප්‍රත්‍යක්ෂ වන කරුණකි.

චිලී දේශයේ තානාපති වශයෙන් වර්ෂ 1929 දී මෙරටට පැමිණ සිටි පැබ්ලෝ නෙරූඩා නමැති චිලී ජාතික කවියාට හමු වූ තංගම්මා නමැති සක්කිලි ස්ත්‍රිය සඳහා ද කිවිඳිය විසින් ඉදිරිපත් කරනු ලබන එක් හෘද සාක්ෂියක් වෙන් කර තිබේ. ඇය පැබ්ලෝ නෙරූඩාගේ නිවසේ වැසිකිළි බඳුන පිරිසිදු කළ ස්ත්‍රිය යි. පහත් යැ යි සැලකු කුලයක උප්පත්තිය ලැබූ වරදට ඇයට කුලීනයන්ගේ අසූචි ඉවත් කිරීමට සිදුවීම ඛේදාන්තයකි.

ඉස්පිලි හොයපු ජීවිත නෙමෙයි පැතුවේ
හැප්පිලි, රැව්ලි බෑ, බයබාදු මතුවේ
දුක්, කිලි කුණු රෙදිය, සදාකල් එතුවේ
සක්කිලි ගෑනු උරුමය රැකිය යුතු වේ
(නිල්මිණි, 2021: 86 පිටුව).

රූමත් කතක් වූ තංගම්මා පිළිබඳ නෙරූඩාගේ සිතෙහි ඇති වූ ඇල්ම නිසා දිනෙක ඇය ඔහුගේ ග්‍රහණයට නතු වෙයි. කෙසේ වෙතත් ඔහු වැනි කුලීනයකුගේ කැමැත්තට විරුද්ධ වීමට තංගම්මාගේ අවසර නැත. බලවතාගේ පයට පෑගී, තැලී පොඩි වී තංගම්මාට අවසානේ ඉතිරි වූයේ හැඟුම්න් තොර සිතක් හා වේදනාවෙන් පිරි කයක් පමණි. මාක්ස්වාදී ස්ත්‍රීවාදයට අනුව කියැවෙන කොමියුනිස්ට් සමාජය මගින් මෙවැනි ගැටලු උදෙසා විසඳුම් ලබා දෙන්නේ ද යන්න විමසා බැලිය යුතු ව තිබේ.

ඉතින් අහවරයි මහතුන්ගෙ කාරිය
හිතින් මකා යනු මේ අරුම නාරිය
මතින් මිදුණු පසු ලැබ පෙර සිහිය වීරිය
හිසින් වඩම්මනු, ඒ කුණු කිලිටි සාරිය
(නිල්මිණි, 2021: 88 පිටුව).

පුරුෂෝත්තමවාදි සමාජයක කාන්තාවකට සිදු වන අතවරයක දී ඇය වෙනුවෙන් පෙනී සිටින පාර්ශ්වයට වඩා ඇයට දෝෂාරෝපණය කරන පාර්ශ්වය සංඛ්‍යාත්මක ව අධික ය. තංගම්මා වැනි ස්ත්‍රියක වෙනුවෙන් පෙනී සිටින ප්‍රජාව තවද සීමා වන්නේ කුල සාධකය පදනම් කොට ගනිමිනි. මෙතෙක් කලකට නොලැබුණු යුක්තිය කාලයේ විනිසුරු හෝ ලබා දෙනු ඇතැයි අපෙක්ෂා පෙරදැරි ව කිවිඳිය තංගම්මාගේ හෘද සාක්ෂිය සමග සිය නිර්මාණය සංග්‍රහය බෙදා ගනී.

පුරුෂාධිපත්‍යය හමු වේ සූරා කෑමට, දූෂණයට ලක් වූ ක්‍රිෂාන්ති කුමාරස්වාමි දැරියගේ හෘද සාක්ෂිය ද මෙවැනි ම වූ ඛේදයකි. යාපනය කල්තඩි ප්‍රදේශයේ ජීවත් වූ මෙම දැරිය හමුදා සෙබළුන් කිහිප දෙනෙකු විනාශ කර දමන්නේ සාහසික ලෙස ය.

පුරුදු මූණු ගැන
මොනවට ද බය වෙන්නෙ
අන්නලා වගෙයි මගෙ...
බයිසිකලයෙන් බැස්සෙ
හිත, හිත එහෙම

එතැනින් පස්සෙ
පිච්ච මල පරවෙන්න ගියෙ
බොහොම පොඩි වෙලාවයි
කයිතඩි
බැරැක්කෙ ඇතුළෙ ම... (නිල්මිණි, 2021: 93 පිටුව).

මේ මතු ද නොවේ. සිය දියණිය සොයා ගෙන පැමිණි ඇයගේ මව, පියා, සොහොයුරා ද මෙම සෙබළුන් විසින් අමානුෂික ලෙස ඝාතනයට ලක් කරනු ලැබූහ. කෙසේ වෙතත් අධිකරණය මගින් එම සෙබළු හය දෙනාහට ම නඩු විභාගයකින් තොර ව මරණ දඬුවම නියම කර තිබේ. කෙසේ වෙතත් නීතිය හමුවට පැමිණ නැති, මෙතෙක් කිසිදු සාධාරණයක් ඉටු නොවූ තවත් ක්‍රිෂාන්තිලා තමන්හට ද සාධාරණයක් සිදු වනු දැකීමට රුචියෙන් බලා සිටින්නාහු ය. ඒ සියලු දෙනා වෙනුවෙන් මේ ක්‍රිෂාන්තිය සිය හෘද සාක්ෂිය මෙලෙසින් ඉදිරිපත් කර තිබේ.

මෙම චරිත හැරුණු කොට කිවිඳිය බෙනාසීර් බූතෝ, මදිව්දිනි එරම්බු, මාගරිතා ගිර්ටුඉඩා, ශ්‍රීමතී චිත්‍රාංගනී ප්‍රනාන්දු විජේවීර, ජෙනී වොන් වෙස්ට්පැලන් (කාල් මාක්ස්ගේ බිරිඳ), වෛද්‍ය ලින් කියව්සෙ, ඒවා ඇනා පෝලා බ්‍රවුන්, රාණි චින්නම්මා, මාතාහරී, ඔල්ගා නිපර්, ප්‍රේමවතී මනම්පේරි, කමලා දාස් වැනි කාන්තා චරිත ගණනාවක් ඔස්සේ ඔවුන්ගේ හෘද වාචික කාලයේ විනිසුරු වෙත ඉදිරිපත් කරයි. හෘද වාචිකාවසානයේ විනිසුරු සිය අවසන් විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කරයි.

ගෙන තනි තනිව විමසා මේ ලියවිල්ල
ගණනය කළ හැකි ද ඒ උණු කඳුළැල්ල
අණසක පරිදි ලෝ ධාතුවෙ පැවතිල්ල
විනිසුරු වුව ද නැත පෙර විදි සැනසිල්ල

කිසිවිට දුක කියා නොවැළපෙන මුහුණු
පිසලන ඇස කඳුළු කොතෙක්දැයි අහනු
උස කඳු කුලුණු සෙවනැලි වැටී වැහුණු
ඇස'ගින් හිනාවෙන උන් ඒ අඬන ගැහැනු
(නිල්මිණි, 2021: 103 පිටුව).

පුරුෂයන්ට සාපේක්ෂ ව ස්ත්‍රිය දරා ගැනීමේ ශක්තියෙන් ඉහළ ය. පුරුෂාධිපත්‍යයෙන් යුක්ත සමාජයේ පැවසෙන පරිදි ස්ත්‍රිය ලඳ බොළඳ තැනැත්තියක නම් ලොව පවතින වඩා වේදනාකාරීම මොහොත ලෙස සැලකෙන දරුවකු බිහි කිරීමේ අවස්ථාවට ඇය මුහුණ දෙන්නේ කෙසේද යන්න ගැටලුවකි. සියලු වේදනා, දුක් කම්කටොලු විඳ දරා ගනිමින් සිනා මුහුණ ම පමණක් ලොවට පෙන්වන ස්ත්‍රියට ලබා දිය හැකි සාධාරණය හමුවේ කාලයේ විනිසුරු ද නිරුත්තර වී ඇත. අවසානයේ ඔහු ද මෙම හෘද වාචික සඳහා යුක්තිය ඉටු කර දීම සමාජයට පවරා පසෙකට වෙයි. ඉදින් මෙතෙක් පැවසූ හෘද වාචික සඳහා ඉදිරියටත් සාධාරණය ඉටු කරන්නට අයෙකු නම් නැත.

වීරිය උරගාන මොහොතකිය සලකනු
කීරිය ගැහෙන කම්මුල් දෙකොන පිසගනු
නාරියෙ'කුගෙ ජීව චරකය ලියැවුණු
ජූරිය ඔබයි දැන් තීන්දුව පවසනු
(නිල්මිණි, 2021: 103 පිටුව).

**නිගමනය**

නිර්මාණයට පාදක වී ඇති වස්තු විෂයවල නිරූපණය කර ඇති ආකාරයෙන් හා නිර්මාණ කෘතියේ අවසානය අනුව නිගමනය කළ හැකි වන්නේ නීතිය හමුවේ ස්ත්‍රීය අපේක්ෂා කරන යුක්තිය, සාධාරණත්වය, සමානාත්මතාව, සම අයිතීන් යනාදිය කවදා කෙදිනක ඇයට හිමිවේද යන්න අවිනිශ්චිත බව යි. නව නිපැයුම්, නව අර්ථකථන හා දර්ශනවාද කෙතරම් ලොව බිහිවුව ද, පුද්ගල චින්තනය වත්මනේ දී පවා පසුගාමී තත්ත්වයක පවතී. දර්ශනවාදීන් ලෝකය හමුවේ නිර්වචන කරන නව්‍ය ධාරාවේ චින්තනාත්මක විපර්යාසය, ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමෙහි ලා අතීතයෙත්, වර්තමානයෙත් අප අපොහොසත් ය. අනාගතයේ ක්‍රියාත්මක වීම අවිනිශ්චිත ය. නමුත් අපේක්ෂා කළ හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

නිල්මිණි, අනුරාධා. (2021). *නාරි සූත්‍රය කාව්‍යාලේඛය*, මහරගම: කේ බුක්ස් ප්‍රකාශකයෝ.

ලියනගේ, කමලා, වලාකුළු, සුමුදු. (2006). *ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය*, කොළඹ 04: පෙඩ්රික් ඊබට් පදනම.